මව්බිම

# මන්ත්‍රීවරුන් අතරෙන් ද්විත්ව පුරවැසිකම ඇත්තේ ගීතාට පමණයි

## පැෆරල් සංවිධානය කියයි

දෙනගම ධම්මික රණවීර

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතරින් ද්විත්ව පුරවැසි බව ලබා සිටින්නේ ගාල්ල දිස්ත්‍රික් එක්සත් ජනතා නිදහස් සන්ධාන පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ මහත්මිය පමණක් බව ආගමන විගමන පාලකවරයා තම සංවිධානයට දැනුම් දී ඇතැයි නිදහස් හා සාධාරණ මැතිවරණයක් සඳහා ජනතා ක්‍රියාකාරිත්වයේ (පැෆරල්) විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා සඳහන් කරයි.

තම සංවිධානය විසින් මීට මාස කිහිපයකට පෙර ආගමන විගමන දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමක් අනුව එම දැනුම් දීම කොට ඇති බවද හෙතෙම පවසයි.